# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය , බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1827/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 11/12/2024<br>පැය 1135 |

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජන මාධ්‍ය වෙත යොමු කිරිම.</u>**

**01. තහනම් ධීවර දැල් උපයෝගී කරගෙන මසුන් අල්ලමින් සිටි සැකකරුවන් 05 දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුර.**

2024.12.10 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලග්ගල පොලිස් වසමේ මොරගහකන්ද ජලාශයේ රුප්පේ ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර තහනම් ධීවර දැල් උපයෝගී කරගෙන මසුන් අල්ලමින් සිටි සැකකරුවන් 05 දෙනෙකු අත්අඩංගුවට ගෙන ජලජීවි වගා සංවර්ධන අධිකාරියේ දඹුල්ල ඉබ්බන්කටුව කාර්යාලයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් 21 ත් 57 ත් අතර වයස් වල පසුවන මාතලේ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුර.**

2024.12.10 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් හිඟුරුකඩුව පොලිස් වසමේ පස්සර ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන හිඟුරුකඩුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 20 ක් වූ පස්සර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

හිඟුරුකඩුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගාල්ල බුද්ධි අංශ කඳවුර.**

2024.12.10 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගාල්ල බුද්ධි අංශ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මීටියාගොඩ පොලිස් වසමේ සීනිගම ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මීටියාගොඩ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 19 ක් වූ හික්කඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**
මීටියාගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කල්මුණ කඳවුර.**

2024.12.09 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කල්මුණ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කලවංචිකුඩි පොලිස් වසමේ තුරෙයිනිලාවනි ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **කේරළ ගංජා කිලෝ 02 ග්‍රෑම් 50 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කලවංචිකුඩි පොලිස් ස්ථානයට භාර දී ඇත.
**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 47 ක් වූ මධ්‍යම කඳවුර 06 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

කලවංචිකුඩි පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. බලපත්‍ර නොමැතිව වැලි කැණීම් කර ලොරි රථයකට පටවමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සමන්තුරය කඳවුර**

2024.12.10 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සමන්තුරය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සමන්තුරය පොලිස් වසමේ සේනවට්ට ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව වැලි කැණීම් කර ලොරි රථයකට පටවමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන සමන්තුරය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 19 ක් වූ සමන්තුරේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** සමන්තුරේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. ගංජා පැළ සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර.**

2024.12.09 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කතරගම පොලිස් වසමේ යාල රක්ෂිත ප්‍රදේශයේ වැටලීමක් සිදු කර **වගා කර තිබූ ගංජා පැළ 92500 ක් සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන කතරගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වූ තුන්කම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** කතරගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**